පසුගිය දින සිදුවූ දිවි අහිමි කර ගැනීමට තැත් දැරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය මගින් වාර්තා කර තිබෙන ආකාරය නිරීක්ෂණය කළ හැක. මෙහිදී මව්බිම පුවත්පත මගින් දිවි අහිමි කරගැනීමට තැත් දැරූ අයගේ ඡායාරූප බොඳ කිරීමකින් හෝ ආවරණය කිරීමකින් තොරව පළ කොට තිබිණි. මේ අතර අද දෙරණ පුවත් මගින් එම අයගේ ඇස් පමණක් ආවරණය කර පෙන්වූ අතර, සිරස ටීවී පුවත් ඔස්සේ එම අයගේ මුහුණ බොඳ කර පෙන්වා තිබිණි. අප විසින් පෝස්ටුවේ අදාළ අයගේ මුහුණ සම්පූර්ණයෙන් ආවරණය කොට දක්වා ඇත.

එසේම මෙම සිදුවීමේදී දිවි අහිමි කරගැනීමට ගිය අයව බේරාගැනීමට උත්සාහ ගත් තවත් අයෙකුගේ දිවි තොර වීම පසුතල කරගනිමින්, දිවි අහිමි කරගැනීමට තැත් කළ අයට දෝෂාරෝපණය කිරීමත්, දිවි අහිමි කරගැනීමට හේතුව සරලව දැක්වීමත් මෙම මාධ්‍යයන් තුළ නිරීක්ෂණය කිරීමට හැකි විණි. මෙම කිසිදු පුවත් විකාශයක් හෝ වාර්තාවක් සමගින් උපකාරක අංක සඳහන් කිරීමක්ද නොවුණි.

මෙම සියලුම කරුණු කාරණා ජාත්‍යන්තර වශයෙන් ජනමාධ්‍ය ආචාර ධර්ම ලෙසින් සඳහන් කිරීමට, දිවි අහිමි කර ගැනීමක් හෝ අහිමි කර ගැනීමට තැත් කිරීමක් වාර්තා කිරීමේදී ජනමාධ්‍ය විසින් අතිශයින්ම ප්‍රවේසම් විය යුතු බව ජනමාධ්‍ය ආචාර ධර්මයන් මගින් අවධාරණය කිරීමට හේතු තිබේ. එවැනි සිදුවීමක් වාර්තා කරනා ආකාරය ඔස්සේ වක්‍රාකාරව තවත් දිවි අහිමි කරගැනීම් වලට අනුබල ලැබීම, දිවි අහිමි කර ගැනීමට තැත් කළවුන් හෝ දිවි අහිමි කරගත් අයගේ සමීපතමයින්ට සිත්වේදනාවන්, අපහසුතාවයන් ඇති වීම වැනි අනිටු ප්‍රතිඵල ඇති විය හැකි බැවිනි.

වගකීම් සහගත මාධ්‍යකරණයක් තුළදී මෙම සියලු කරුණු සැලකිල්ලට ගැනීම අනිවාර්ය බවද මෙසේම සඳහන් කරමු.
ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම පිළිබඳව නිකුත්කොට ඇති මාධ්‍ය මාර්ගෝපදේශනය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D92B6792D233E0ABFBEC1D53800BC071?sequence=1

#MediaEthicsSL #lka #SinhalaPress #TV #News #SirasaTV #TVDerana #SundayMawbima
— with දේදුනු සංවාද and WHO Sri Lanka.